# ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්තයේ ව්‍යාප්තිය සමඟින් කාන්තාවට සිදුවන බලපෑම

ඒ.ඒ.එම්.කේ අමරසිංහ[1]

**සංක්ෂේපය**

ඕනෑම රටක් සංවර්ධනය කරා ගමන් කිරීමේ දී විවිධාකාර වූ ප්‍රවේශයන් හඳුනාගනී. ඒ අතරින් රටක ආදායමේ වර්ධනයට වැදගත් ක්ෂේත්‍රයක් ලෙස කර්මාන්ත ක්ෂේත්‍රය හඳුන්වා දිය හැක. 1948 න් පසු අරඹන ශ්‍රී ලංකා ඉතිහාසයේ නව ගමන් මගේ සංවර්ධනය උදෙසා ගත් පියවරක් ලෙස ආනයන ආදේශන ප්‍රතිපත්තිය හරහා දියුණු වූ කර්මාන්ත අතර ඇඟලුම් කර්මාන්තයට හිමි වී ඇත්තේ තුන්වන ස්ථානයයි. ඒ තුළින් ලබාගත හැකි වැදගත් ආර්ථික වටිනාකම් බොහෝ ය. විවෘත ආර්ථිකය තුළ මුදල් යනු අත්‍යාවශ්‍ය සාධකයකි. එහිදී ස්ත්‍රී, පුරුෂ භේදයකින් තොරව සියලු දෙනාටම තම අගහිඟකම් මග හරවාලනු උදෙසා රැකියාවක නිරත වීමට සිදු වේ. බොහෝ විට නිවසක පුරුෂයා අනිවාර්යයෙන් කුමන හෝ රැකියාවක නිරත වෙයි. එහෙත් 21 වන සියවසේ තරඟකාරීත්වය තුළ එය වෙනස් වී ඇත. වර්තමානයේ රැකියාවල නිරත වන කාන්තාවන් පිරිස වර්ධනය වන අතර එමඟින් ඇතිවන ගැටලුද වර්ධනය වේ. ඒ අතර ඇඟලුම් ක්ෂේත්‍රයේ නියැලෙන කාන්තාවන් විශාල ප්‍රමාණයකි. මෙම අධ්‍යයනය තුළින් ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්තයේ ව්‍යාප්තියත් සමඟ කාන්තාවට සිදුවන බලපෑම පිළිබඳ විමර්ශනය කර ඇත. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවය කරන කාන්තාවන් 50ක නියැදියක් පහසු නියැදීම් ක්‍රමය යටතේ තෝරාගෙන ඇත. දත්ත ලබා ගැනීම සිදු කරනු ලැබුවේ සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතයෙනි. අධ්‍යයනය මඟින් අනාවරණය වූයේ එම ප්‍රදේශය තුළ ඇඟලුම් කර්මාන්තය ආරම්භ වීමත් සමඟ කාන්තාවන් විශාල වශයෙන් වයස් භේදයකින් තොරව ඒ කරා ඇදී ඒමත් , ඒ තුළින් කාන්තාවන්ගේ ආර්ථික තත්ත්වය කිසියම් දුරකට ශක්තිමත් වී ඇති බවයි. රැකියාව සමඟ මව්වරුන්ගේ කාර්ය බහුලත්වය නිසා පුරුෂයා විසින් කාන්තාව තාඩන පීඩන වලට ද ලක් කර ඇති අතර දරුවන් ද මෙම ගැටලු නිසා පීඩාවට පත්ව ඇත. කෙසේ වුවද මෙම ප්‍රදේශය තුළ ඇඟලුම් කර්මාන්තය ආරම්භ වීම හේතුවෙන් එය අවට ජීවත් වන ජනතාවගේ ආර්ථික තත්ත්වය ඉහළ ගොස් ඇති අතර ඔවුන්ගේ ආදායමේ ද වර්ධනයක් සිදු වී ඇති බව හෙළිවිය. මේ අනුව ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්තයේ ව්‍යාප්තිය සමඟින් කාන්තාවගේ පවුල් පසුබිමට බලපෑම් ඇති වී ඇති බැව් නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද :** *ඇඟලුම් කර්මාන්තය, කාන්තාව, ආර්ථික ප්‍රතිලාභ*

---

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය,
k.amarasinghe92@gmail.com